සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 21 S I |
|---|---|---|
| නම: ........................................... | සිංහල භාෂාව හා සාහිත්‍යය I | කාලය පැය එකයි |

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්, ඔබ තෝරගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තදකළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීපදෙන උත්තරය තෝරන්න.

01. ඔහු මෙතෙක් කළ කාර්යයන් හය හතර නොදන්නා කෙනෙක් කළ කාර්යයක් සේ යැයි ඇතමෙක් කීහ.
1. කිසිම දෙයක් ගණන් නොගන්නා.
2. දැනුම් තේරුම් නොමැති.
3. සමච්චලයකට පත් වූ.
4. කිසිදු අධ්‍යාපනයක් නොමැති.

02. නිමල් නිරතුරුව ම කාලය ගත කළේ හෝන්දු මාන් දූ වූවකු ලෙස ය.
1. කම්මැළි.
2. අසාධ්‍ය.
3. රෝගී.
4. මංමුළා.

03. නිලධාරීන් අතර වූ කඹ ඇදිල්ල නිසා සංචාරක කර්මාන්තය යළිත් අඩපණ විය.
1. කඹ ඇදීමේ තරගය.
2. තම සිතැගියාවට අනුව කටයුතු කිරීම.
3. එකඟතාවයක් නොවන.
4. දුර්වල තීරණ ගැනීමේ හේතුව.

- 4 සිට 6 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. වචන මාර්ගයෙන් දෙදෙනෙකු අතර සිදුවනුයේ,
1. විලාපය කි.
2. ප්‍රලාපය කි.
3. ආලාපය කි.
4. සංලාපය කි.

05. යම් විපතක් ආපදාවක් ලෙස සැලකීමට ජාත්‍යන්තරව පිළිගත් ................................... තිබේ.
1. නිර්ණායක.
2. තීරණ.
3. අරමුණු.
4. කරුණු.

06. ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ ........................................... ඔවුන් පෙලඹවීම සඳහා උන්වහන්සේ කළ නිර්මාණ බොහෝ ය.
1. ඉෂ්ටාර්ථයෙන් .
2. පරමාභිලාෂයෙන්.
3. අභිමානයෙන්.
4. අනුබලයෙන්.

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. ඖෂධ, විද්‍යාත්මක, විශේෂ, පරිසණක.
2. මූලෝත්පාටන, පිළිබිඹු, දේශාභිමානි, අබිමානයක්.
3. සෞන්දර්යය, ඓතිහාසික, ප්‍රතිභාව, ස්වදේශිකයන්.
4. අතිශයෝක්ති, කෘත්‍යාධිකාරි, සොභාවෝක්ති, උත්ප්‍රේක්ෂා.

08. යොවුන්, නිරූපණය, විවෘත, මහෞෂධ යන වචනවල දෙවන අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
1. කෙටි පාපිල්ල, දීර්ඝ ඇදය, ගැටය සහිත ඇලපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත.
2. කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත.
3. කෙටි ඉස්පිල්ල, දීර්ඝත්ව සලකුණ, ගැටය සහිත ඇලපිල්ල, කොම්බුව හා ඇලපිල්ල.
4. කෙටි වක් පාපිල්ල, ඇදය, ගයනුකිත්ත, කොම්බුව හා ගයනුකිත්ත.

09. "පිරුණු" යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ගය වනුයේ,
1. ඕෂ්ඨජ අක්ෂර හා දන්තජ අක්ෂර.
2. දන්තජ අක්ෂර, මූර්ධජ අක්ෂර.
3. ඕෂ්ඨජ, තාලුජ අක්ෂර, දන්තජ අක්ෂර.
4. ඕෂ්ඨජ අක්ෂර හා මූර්ධජ අක්ෂර.



EXAMRESULTS.LK

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
1. කොළඹ, කතරගම, මාතර, පානදුර.
2. රංකිරා, උපාලිස්, බන්දුසේන, අයිරාංගනී.
3. කලියුගය, ගම්පෙරළිය, යුගාන්තය, සෝමා.
4. වාලුකාංගණය, චෛත්‍යය, ථූපඝරය, චේතියඝර.

11. අනුක්ත නාම පද දෙකක් හා උක්ත නාම පද දෙකක් සහිත වචන තෝරන්න.
1. ඇතැමෙක්, දරුවන්, කෙනෙකු, ඕ තොමෝ.
2. දරුවන්, මා, තා, ඔවුහු.
3. දැරියක්, නුඹ, අපි, තෝ.
4. ඔවුහු තුමු, භිගන්නියක, කාන්තාවන්, නැගණියන්.

12. පුවත්පත ඔවුනොවුන් අතරේ බෙදා දුනි. යන වාක්‍යයෙහි ඔවුනොවුන් යන්නෙහි සන්ධි වර්ගය කුමක් ද?
1. ස්වරාදේශ සන්ධිය.
2. ස්වර සන්ධිය.
3. ගාත්‍රාදේශ සන්ධිය.
4. පරරූප සන්ධිය.

13. සොඬු, වාල් යන පදයන්ට සමාන පද පිළිවෙළින් දක්වා ඇති වරණය වන්නේ,
1. දාසයා, වැල්.
2. වහල් , හොඬවැල.
3. කම්මුල , දාසයා.
4. කම්මුල , හොඬවැල.

14. නීති + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍ය එක් වූ විට සකස්වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
1. නෛතීක.
2. නීතික.
3. නීතිඉක.
4. නෛතික.

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
1. මිශ්‍ර ක්‍රියා - වයවයා, දක්වමින්, සොයා සොයා, කියමින්.
2. ස්වරාදේශ සන්ධිය - වටොර, පංචේන්ද්‍රිය, අතීන්ද්‍රිය, පූජෝපහාර.
3. අසම්භාව්‍ය ක්‍රියා - සොයද්දී, නැටුවොත්, නැටූ, කීවොත්.
4. නිපාත - සඳහා, ඊයේ, සෙද, අනේ.

• අංක 16 සිට 18 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දක්වන පිළිතුර තෝරන්න.

16. ගුරු හිමියන්ගේ භාෂාන්තර ඥානය පිළිබඳ දෙස් විදෙස් රටවල් පුරා ම පැතිරෙන්නට විය.
1. ස්වදේශ භාෂාත්මක දැනුම.
2. ජාත්‍යන්තර දැනුම.
3. විවිධ භාෂා පිළිබඳ දැනුම.
4. තමා විසින් ම දැනගත් දැනුම.

17. සුසැට බරණින් සැරසීලා - නා කපනා වැසි වසින වෙලේ..............
1. හැට හතරක්.
2. රත්තරන් කැට.
3. මැණික් කැට.
4. හැට අටක්.

18. දේශකයාණෝ සාරගර්භ දේශනයක් කළහ.
1. සාරවත් වූ ගර්භයක්.
2. සාර වූ ආරම්භයකින් යුක්ත.
3. සරු තෙපුල්වලින් යුක්ත.
4. සාරවත්භාවයෙන් පිරුණු.

19. ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් අඩංගු වී ඇති වාක්‍යය කුමක් ද?
1. මා වැඩ කරද්දී ඔවුහු බලාගෙන සිටියහ.
2. නංගී මල්ලී ලවා වැඩ කරවයි.
3. දරුවනි මෙතැනින් ඉක්මනින් පලා යවැ'යි මැණිය කීවා ය.
4. ඔවුහු සිනාසෙමින් ඒ මේ අත දිවූහ.

20. නිවැරදි විරුද්ධාර්ථ පද යුගලය සහිත පිළිතුර තෝරන්න.
1. මල - නිමල
2. අඳ - ගොළු.
3. ප්‍රබල - අතිප්‍රබල
4. සමර - අමර

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
1. ලකළ - අලංකාර, උදුළ - බබළන, සොමි - සෞම්‍යය, විලිකුන් - ඉඳුණු.
2. ඉඳුහ - සෘද්ධි, අඳුන් - අංජන, කුඹල් - වළං, අමා -රසය.
3. කලදෝ - රිදී, පසිදු - ප්‍රසිද්ධ, නිකෘෂ්ට - නිකළැල්, සහසකර - චන්ද්‍රයා.
4. රිසි - කැමති, නිසයුරු - රාත්‍රිය, පුවළ - පැතිර, නිසඹු - අඹුව.

22.පහත වාක්‍ය අතුරින් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.
1. 'දෙවැනි තැන ලැබන්නේ බුදුන් වහන්සේගේ ශාරීරික ධාතුවට වඩා බෝධියකට ය.
2. ආරාමයක දී බෝධියට ශාරීරික ධාතුවට ලැබෙන ගෞරවය පමණක් දෙවෙනි තැනය.
3. ආරාමයක දී බෝධියට ලැබෙන්නේ ගෞරවයට පමණක් දෙවෙනි තැනකි බුදුන්ගේ ශාරීරික ධාතුන්ට ලැබෙන.
4. ආරාමයක දී බෝධියට ලැබෙන්නේ බුදුන්ගේ ශාරීරික ධාතුන්ට ලැබෙන ගෞරවයට පමණක් දෙවෙනි වන තැනකි.

• 23 සිට 24 ප්‍රශ්න යටතේ දක්වා ඇති ප්‍රස්තාව පිරුළේ අදහසට වඩාත් ම ගැළපෙන අර්ථය අන්තර්ගත වරණය තෝරන්න.

23. දත නැතිදා උක්දඬු ගිනි තපින්න ද?
   1. නිසි වේලාවට ඇති දේ වැඩක් නැත.
   2. නිසිඵල ලබාගත නොහැකි වීම.
   3. දත් නැති විට උක්දඬු සැපිය නොහැකි බව.
   4. බොහෝ කාලයක් ජීවිතය පවතින්නේ නැති බව.

24. සෙක්කුවේ බැන්ද ගොනා වගේ,
   1. නිෂ්ඵල කාර්යයක් කිරීම.
   2. කඩින් කඩ වැඩපලට නිරත වීම.
   3. ගොනෙකු සේ වැඩ කළ යුතු බව.
   4. කිසිදු විවේකයක් නොමැතිව එක දිගටම කාර්යයේ නියැලීම.

25. "අධමයන්ට උතුම් දෙයක ඵලක් නැත" යන්නට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ වනුයේ,
   1. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ.
   2. ඌරෝ කවද ද කහ කෑවේ?
   3. කළුවා මාරපන ගියා වගේ.
   4. ඉබ්බා අහසින් ගියා වගේ.

26. නිවැරදි වරණය තෝරන්න.
   1. පූර්ණ නාසික්‍ය අක්ෂරය වන්නේ (අ)ඃ ය.
   2. ''ශ'' අඝෝෂ අක්ෂරයකි.
   3. සිංහල අක්ෂර මාලාවේ වර්ගාන්ත අක්ෂර 25 කි.
   4. ඉසුරුමත් යනු උපසර්ග පදයකි.

• 27 සිට 29 දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

27. 1. ඔවුන් මා පසුපස එද්දී ක්‍රීඩකයෝ බලා සිටියේ ය.
   2. නංගී ද මල්ලී ද මම ද ක්‍රීඩා පිටියට ගියෙමු.
   3. ඔවුහු පාසල් ගොස් වැඩ කරනු ඇත.
   4. දරුවෝ අපක්ෂාතීව වැඩ කරනු යෙහෙකි.

28. 1. ගංවතුරට පැල්පත් කඩා වැටුණහ.
   2. නිවේදිකාවක විසින් කනගාටුදායක පුවතක් නිවේදනය කරන ලදී.
   3. ප්‍රකට සංගීතඥයෙක් වූ ඩබ්.ඩී. අමරදේවයාණන් දැයෙන් සමු ගත්හ.
   4. සියලු සත්ත්වයන් නිදුක් වෙත්වා.

29. 1. ඔවුන් යුක්තිය විසඳා ගන්නේ කෙසේ ද?
   2. මහවර්ෂාවෙන් පසු පියුම්හු විකසිත විය.
   3. මැණියන්දෑ පාන්දරින් ගමන සඳහා සූදානම් විය.
   4. තෙරපා ජේතවනාරාමයේ සිට පිඬුසිගා වැඩියේ ය.

30. පහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් ම යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර තෝරන්න.

   A - සමඟ
   B- සඳහා
   C - පවා
   D - පිණිස

   • වර්තමානයේ කුඩා පාසල් දරුවා .............................. නව තාක්ෂණික මෙවලම් භාවිත කරයි.
   • මියගිය උපාසිකාවට පිං .............................. දාන ශාලාවක් ඉදි කෙරිණි.
   • දරුවා සිය මව .............................. පාසල් ගියේ ය.
   • වික්‍රමසිංහ සූරින් සිංහල සාහිත්‍යය .............................. කළ අභිමානවත් සේවය පැසසිය යුතු ය.

   1. CDAB
   2. CDBA
   3. ABCD
   4. ACDB

31. පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
   • ඔක්කොම ඥාතියෝ ආවොත් මං ඔවුන් සමඟ පිටත් වෙනවා.
   1. සියලු ඥාතියෝ පැමිණියහොත් මම ඔවුන් සමඟ පිටත් වෙමි.
   2. සියලු ඥාතීන් පැමිණියහොත් මම ඔවුන් සමඟ පිටත් වෙමි.
   3. සියලු ඥාතියෝ පැමිණියහොත් මා ඔවුන් සමඟ පිටත් වෙමි.
   4. සියලු හිතවතුන් පැමිණියහොත් මම ඔවුන් සමඟ පිටත් වන්නෙමි.

32. උපමාවක් සහිත කවිපදය තෝරන්න.
   1. දෙයක් වේ නම් එය සුදුස්සාට ම අයිති විය යුතුය.
   2. පුල් නිලුපුල් සම් වත් කතක වුවනත.
   3. පතසත් අවරගිරි නැටියෙන් වැටෙන කල.
   4. අම්මා සඳකි මා ඒ ලොව හිරු ය රිදී.

33. පහත සඳහන් කවියේ දෙවන පදය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

හැම ගනඳුරු බොන වර නිසයුරා ගත
..........................................................................
පුල් නිලුපුල් සම්වන් කතක වුවනත
කලදෝ කැට තෙලෙක දිසිවැන පැහැ දිමුත

1. උදයග රුක සඳ මල් කැනක සිරි ගත
2. දිවගත එවි බියෙනැ' ලළෙමිනි දස අත
3. පහන් බැවින් පිටතට සස ලෙසින් වත
4. තර පතරින් සඳ' දර කර පහර දෙත

34. පැණි කොමඩු වැල
යන එන හැම තැනක ම............
යන කවිය නිර්මාණය කර ඇත්තේ,

1. මහගම සේකර මහතා ය.
2. ඩබ්ලියු.ඒ. සිල්වා මහතා ය.
3. රුවන් බන්දුජීව මහතා ය.
4. මොනිකා රුවන් පතිරණ මහත්මිය ය.

35. 'රචකයා අසා, දැක කියවා විඳ ඇති දේ ඇසුරින් පරිකල්පනය මගින් ගොඩනැගූ යථාර්ථය, නිර්මාණයේ අන්තර්ගතය වෙයි.' යන වාක්‍යයේ පරිකල්පනය යනු,

1. මතුපිට අර්ථය ඉක්මවා යන සැඟවුණු අර්ථයක් ඇති.
2. මැනවින් පුරුදු පුහුණු කරන ලද.
3. ස්වභාවිකත්වය ඉක්මවා යන අදහසක් ඇති.
4. සාහිත්‍ය නිර්මාණට සඳහා අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම.

36. යුද්ධයෙන් දිනීමට නම් සතුරු සේනා මූලෝත්පාටනය කළ යුතු ය. මෙහි මූලෝත්පාටනය යනුවෙන් අදහස් කරන්නේ,

1. ඝාතනය.
2. උදුරා දැමීම.
3. මුලිනුපුටා දැමීම.
4. ඡේදනය.

37. නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍යයක් වනුයේ,

1. හුණුවටයේ කතාව.
2. රත්තරං.
3. සිංහබාහු.
4. එලොව ගිහින් මෙලොව ආවා.

38. <u>අසරණ දරුවෝ</u> වීථිය පුරා ඒ මේ අත ගමන් කරති. මතින් තොර ව නිරෝගි ව <u>ජීවත් වන්න</u>. ගුණපාල <u>නිවටයකු</u> මෙන් හිස වැනුවේ ය. ඔවුහු සේවකයන් ලවා කාණුව පිරිසිදු <u>කරවති</u>.

ඉහත සඳහන් වාක්‍යවල තදකළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනු අංගවල අනුපිළිවෙළ කුමක් ද?

A - උක්ත කර්තෘ.
B - අනුක්ත කර්තෘ.
C - ප්‍රයෝජ්‍ය ක්‍රියා.
D - විධි ක්‍රියා.

1. ADBC
2. ABCD
3. ACDB
4. BDAC

39. කමත් භාෂාවේ දී මැඩුවන් යනුවෙන් අදහස් කරනුයේ,

1. වී ය.
2. දැකැති ය.
3. උදේ ආහාරය ය.
4. පිදුරු ය.

40. පහත සඳහන් කවි පදවල අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

සිඳු තුළ නො සිට නැඟි මෙන් වළබ ගිනි වැට
දිසි යළ පබළ කලබෙව් ලෙළ තරඟ පිට

1. සාගරය තුළ නොසිට සෙලවන දියරැළි පබළු සමූහයක් මෙන් ඈත අහසේ දිස්වෙයි මිතුර.
2. මිතුර වඩබා ගිනි පෙළ සාගරය තුළ නොසිට නැඟුණ මෙන් ද නැතහොත් සෙලවෙන්නා වූ දියරැළි මත පබළු සමූහයක් මෙන් ද දිස්වෙයි.
3. මිතුර හැන්දෑ කාලයේ දී සාගරයේ සිදුවන වඩබා දියරැළි පබළු සමූහයක් සේ ඈත අහසේ දිස් වේ.
4. වඩබා ගිනිපෙළ දිය තලයේ නොසිට අහසට නැඟුණක් මෙන් නැතහොත් පබළු සමූහයක් මෙන් අපට දක්නට ලැබේ.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 21 S II

සිංහල භාෂාව හා සාහිත්‍යය II | කාලය පැය දෙකයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01)i. අර්ධ ස්වර අක්ෂරයක් යෙදුණු වචන දෙකක් ලියන්න.

ii. පහත දැක්වෙන වැකියේ වචන දෙකක අක්ෂර වින්‍යාසය වැරදි ය.ඒ වචන දෙක පමණක් නිවැරදිකර ලියන්න.

(අ) 'සිංහල භාෂාව ආරම්භ වී විකාෂනය වූ ආකාරයත් කියාපාන ලේකනාවලියක් අප සතු ය'

iii. පහත දී ඇති පාඨයෙන් රූපක දෙකක් උපුටා ලියන්න.

(අ) ''එතෙපුල් නැමැති අමා හැල්ලෙන් කෝ ගිනි කඳ නිවී ගියේ.....''

iv. පහත වාක්‍ය නිවැරදි කර ලියන්න.

(අ) ගුවන්යානා පෙළ ඇත අහසේ කරණම්ගසති.

(ආ) ඕ තොමෝ ආදරයෙන් සෙනහසින් මව රැක බලා ගත්තේ ය.

v. පහත සඳහන් පද්‍ය කොටසේ යෙදී ඇති <u>නිපාත පද දෙකක්</u> උපුටා දක්වන්න.

' මිදුලේ පහන් පැලේ නිතර
සැලුණු දැල්ල නිවී ගොස් ය
ඉඳහිට ගේ පිළිකන්නේ
බල්ලෙකු උඩු බුරනු ඇසේ '

vi. පහත යෙදී ඇති ඡේද කොටසින් නිපාත පදයක් හා උපසර්ග පදයක් උපුටා ලියන්න.

"අශෝක අධිරාජ්‍යයා, ලවා ශ්‍රී මහා බෝධීන්වහන්සේ මෙරටට වැඩම කරවීමට කටයුතු සම්පාදනය කිරීමත් සමග ම විශිෂ්ට බුද්ධියක් සහ කුසලතා දක්ෂතා ඇති...."

vii. පහත සඳහන් පද විසන්ධි කරන්න.

(අ) දුංකොළ. (ආ) තුනුවඟ.

viii. පහත සඳහන් වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට හරවන්න.

(අ) බල්ලෙක් හාවෙකු පසුපස දුවයි. (ආ) සෙබලමුළ සතුරන් මර්දනය කළහ.

ix. පහත දැක්වෙන අදහස් දීමට සුදුසු ඉඟිවැකි ලියන්න.

(අ) සායම ගියා. (ආ) අගයක් නොමැති වීම.

x. පහත දී ඇති වාක්‍යයට සුදුසු පරිදි විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(අ) මගේ වින්දනයට හේතු වුයේ මේ කරුණු එම කරුණු සලකතොත් ඔබට ද එබඳු වින්දනයක් ඇතිවිය යුතු ය යි ඔහු කියයි. (ලකුණු 2×10-20)

(02) පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250 නො අඩු වන සේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදා ගන්න.

(අ) අන්‍යෝන්‍ය අවබෝධය හා සබඳතාව ගොඩ නැගෙන සාමය මානව වර්ගයාගේ සුභසිද්ධියට හේතු වන්නේ ය. මේ සඳහා ලෝකයේ පවත්නා අසරණ භාවය තුරන් කිරීමට හා යුද්ධය පිටු දැකීමට මුල් තැන දිය යුත්තේ ය. මෙම කරුණු උදෙසා අතිමහත් පරිශ්‍රමයක යෙදෙන ජගත් සංවිධාන අපේ පැසසුමට ලක්විය යුතු ය. අපේ ප්‍රාර්ථනය සාමයෙන් හා සාධාරණත්වයෙන් හෙබි ලෝකයකි.

(ආ) සිනමාව, රූපවාහිනිය, සමාජ මාධ්‍ය ආදියේ බලපෑම් නිසා ද අපේ ළමයි වෙතින් කියවීමේ පුරුද්ද ටිකෙන් ටික ඈත්වන බවක් පෙනේ. ළමයින් තුළ කියවීමේ පුරුද්ද ඇති කිරීම පාසලටත්, ගෙදරටත්, රජයටත් පැවරෙන විශාල වගකීමකි. කියවීමේ පුරුද්ද කුඩා කල සිට ම ඇති කළ යුත්තේ එය සාර්ථක ජීවිතයක ජය මග වන බැවිනි. කියවීම සම්පූර්ණ මිනිසෙකු තනයි යන කියමන ද අප වැළඳගත යුතුය.

(ඉ) අපේ දියුණුව උදෙසා දෙමාපිය වැඩිහිටියන්ගේ සිදු වුයේ අප්‍රමාණ සේවයකි. ඔවුහු වයස් ගත වූ පසු ද දරුවන් සෙවනේ සිටීමට ප්‍රිය කරති. වර්තමානයේ බිහිවන වැඩිහිටි නිවාස කියාපාන්නේ ඊට පටහැනි තත්වයකි. වැඩිහිටියන් තමාගේ සෙවනේ ම ආදරෙන් රැකබලා ගැනීම සමාජයේ යුතුකමකි.

(ඊ) නිරෝගි සිරුරක් තුළ නිරෝගි මනසක් බිහි වේ. ක්‍රීඩාවෙන්, ඉවසීම, ආත්ම විශ්වාසය, චිත්ත ධෛර්යය විඳ දරා ගැනීමේ හැකියාව වැනි ගුණාංග දියුණුවේ. ක්‍රීඩාව සමබර පෞරුෂයකට මග කියාදෙයි. (ලකුණු 25)

03. පහත සඳහන් ඡේදය වචන 45-50 අතර ප්‍රමාණයකින් සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

මානව වංශ කතාව පිළිබඳ මෙතෙක් අනාවරණය කර ගනු ලැබ ඇති තොරතුරු අනුව, කථාබහ මගින් අදහස් හුවමාරු කර ගැනීමේ පුරුද්දට දිගු ඉතිහාසයක් ඇත. ආදී මානවයා දෙපයින් සිට ගන්න හුරු වීම මානව පරිණාමයේ එක් වැදගත් සන්ධිස්ථානයකි. මේ නිසා ආදී මානවයාගේ දෑත් නිදහසේ වඩාත් කාර්යක්ෂම ලෙස භාවිත කළ හැකි විය. ඔහුගේ මොළය ද සෙසු සතුන්ගේ මොළය අබිබවා ප්‍රමාණයෙන් ද කාර්යක්ෂමතාවෙන් ද වැඩිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ශබ්ද මගින් සිතැගි පළ කිරීම මග අනාවරණය කර ගැනීමට ඔහු සමත් විය. ශබ්ද මගින් සිතැගි පළ කිරීම යනු භාෂණයට හුරු වීම ය. මෙය අවුරුද්දකින් දෙකකින් සිදු වූවක් නොව ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලේ අනුක්‍රමයෙන් වර්ධනය වූවකි. ශබ්ද අතර වෙනස හඳුනා ගැනීමටත්, එකිනෙකට වෙනස් ශබ්ද සංකලනය කොට සිතැගි හා අදහස් පළ කරන වචන නිර්මාණය කර ගැනීමටත් ආදි මානවයා දිගු කලක් ගත කරන්නට ඇත. මානව විද්‍යාඥයන් එළවන සාක්ෂ්‍ය අනුව, මීට අවුරුදු දස ලක්ෂයකට පෙර මිනිසා භාෂණය මගින් සිතැගි පළ කිරීම ආරම්භ කළේ ය. (ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

හෙළ හවුලේ කාව්‍ය සම්ප්‍රදාය කොළඹ යුගයෙහි කැපී පෙනෙන කාව්‍ය සම්ප්‍රදායකි.මුල් යුගයේ ආරම්භ වුණු ජාතික ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්මල සිංහල භාෂාවක් පිළිබඳ අදහස විසින් මෙහෙයවීමෙන් නිර්මල නව කාව්‍ය සම්ප්‍රදායක අවශ්‍යතාව ද ඇති විය. කුමාරතුංග මුනිදාසගේ පුරෝගාමිත්වයෙන් ඇරඹුණු හෙළ හවුලේ කවිය නියෝජනය කරන කවීන් අතර රැයිපියල් තෙන්නකෝන්, අරීසෙන් අහුබුදු, අමර සිරි ගුණවඩු, වරකාගොඩ සිළුවන් හිමි, අලවුඉසි සැබිහෙළ, හියුබත් දිසානායක යනාදීහු වෙති. මේ කාව්‍ය සම්ප්‍රදාය ට ඊට ම අනන්‍ය ගතිලක්ෂණ කිහිපයක් දරා ගෙන සිටියි. විශේෂයෙන් ඔවුන්ගේ කාව්‍ය භාෂාව සකස් වූයේ හුදු හෙළ වදන් ඇසුරිනි. ඒ නිසා ම ගී කාව්‍ය භාෂාවට තරමක් සමීපතාවක් ඇත. තව ද ශබ්ද රසය බැහැර කරන මෙම කවීන් අර්ථ රසෝත්පාදනයෙහිලා වැඩි නැඹුරුවක් දක්වන ආකාරය පෙනේ. කාව්‍යකරණයෙහිලා නිරවද්‍ය භාෂා ව්‍යාකරණය කර භාවිතය ද ඔවුන්ගේ ඇගයීමට ලක් විණි. කවියෙහි ආකෘතික පක්ෂයෙහි විශාල වෙනසක් මේ සම්ප්‍රදායේ කවියෙන් දිස් වෙයි. ගතානුගතික සිවුපද ආකෘතියෙන් සිංහල කවිය නිදහස් කිරීමේ බීජාවස්ථා හෙළ හවුලේ කවියෙන් ප්‍රදර්ශනය වන අතර මොවුන් බහුල වශයෙන් කාව්‍යකරයෙහිලා සිලෝ විරිත භාවිතයට ගත් ආකාරය ද හඳුනා ගත හැකි ය. උපහාස රසය මුල් කොට ගත් සමකාලීන සමාජය මේ කවීන්ට වස්තුවිෂය විය. හෙළ හවුල අලුත් කාව්‍ය සම්ප්‍රදායක් නිර්මාණය කළ ද ඒ නිර්මාණ සාමාන්‍ය ජනයාගෙන් දුරස්ථ වූයේ එහි ඇති අතිශය කෘත්‍රිම බව නිසා ය. එහෙත් කුමාරතුංගගේ ළමා පද්‍ය, පොදු ජන විඥානයේ තැන්පත්ව ඇත.

(i) හෙළ හවුලේ කාව්‍ය සම්ප්‍රදායේ පුරෝගාමියා කවුරුන් ද?
(ii) හෙළ හවුලේ කවීන් දෙදෙනෙක් නම් කරන්න.
(iii) මෙම කාව්‍ය සම්ප්‍රදායට ආවේණික අනන්‍යතා ලක්ෂණ දෙකක් ලියන්න.
(iv) හෙළ හවුලේ කවීන් බහුල වශයෙන් භාවිත කළ විරිත කුමක් ද?
(v) හෙළ හවුලේ කවීන්ගේ වස්තු විෂය කුමක් ද? (ලකුණු 2×5=10)

(05) පහත දැක්වෙන්නේ කිසියම් වෙළෙඳ දැන්වීමකින් උපුටා ගත් කොටස් කිහිපයකි.

| | | | |
|---|---|---|---|
| ජනවාරි මාසය තුළ 15% වට්ටම් සහිත ව ලබාගත හැක. | සතියේ දිනවල උදේ 6 සිට සවස 5 දක්වා ද සෙනසුරාදා දිනවල සවස 2.30 දක්වා ද විවෘත යි. සෑම ඉරු දිනකම හා වෙළෙඳ නිවාඩු දිනක ම වසා | ජපන්, ජර්මන්, ප්‍රංශ, ඉංග්‍රීසි, සිංහල, දෙමළ, පාලි, සංස්කෘත ආදී විවිධ භාෂා ඉගෙනීමේ පොත්-පැරණි වෛද්‍ය, ජ්‍යොතිෂ, නක්ෂත්‍ර හා සාහිත්‍ය පොත්. | විස්තර සඳහා නොමිලේ දෙන පොත්, විස්තර සහ මිල දර්ශනය ලබා ගන්න. |

මෙම තොරතුරු ඇසුරු කරගෙන රුවන් වැල්ල, පළමු වැනි පටුමගේ පිහිටි මිහිර පොත්හල 2024 ජනවාරි මාසයේ තම ප්‍රචාරක කටයුතු සඳහා පිළියෙල කළ දැන්වීම ට වචන 100කින් පමණ ලියන්න. (ලකුණු 15)

<u>නැතහොත්</u>

නියමිත කාල සටහනකට, ස්ථිර බස්රථයක් ධාවනය නොවන 'සුධීරගම' ගම්වාසීන්ට හා පාසල් සිසුන්ට ප්‍රධාන නගරය වන මහදිවුල්වැව ට දුෂ්කර ගමනා ගමනා ගමනයක යෙදීමට සිදුව ඇත. ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධනය සමිතියේ ලේකම් වන නාමල් රත්නායක ඔබ යැයි සිතා ගමට බස් රථයක් ඉල්ලමින් ප්‍රදේශයේ ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඩිපෝ අධිකාරීතුමාට යවන ලිපිය ලියන්න. (වචන 100 පමණ ප්‍රමාණවත්) (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 21 S III

සිංහල භාෂාව හා සාහිත්‍යය III | කාලය පැය එකයි

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුර සපයන්න.
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "මහරජ, නො සිතා වදාළ මැනව මාගේ බලවත් අනෙක් උපායක් ඇත"
(අ) මෙහි මහරජ යනුවෙන් ඇමතුම් ලබන රජතුමා කවුරුන් ද?
(ආ) මේ ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?

ii. පහත දැක්වෙන කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට
ඉටන් බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
(අ) ..........................................
(ආ) ..........................................

iii. (අ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා ලියූ නවකතා දෙකක් ලියන්න.
(ආ) එතුමා ලියූ ස්වයං ලිඛිත චරිතපදානයේ නම කුමක් ද?

iv. (අ) "මුනි සිරිපා සිඹිමින්නේ" පාඩමට පාදක කරගත් කාව්‍ය පන්තියේ නම කුමක් ද?
(ආ) එස්. මහින්ද හිමියන් කවි ලියූ ප්‍රධාන තේමා දෙකක් ලියන්න.

v. "මිනිහා අනුමානයක් නෑ මැරෙන්ඩ ඇති"
(අ) මේ කාගේ ප්‍රකාශයක් ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය ලියවුණු වර්ෂය කුමක් ද?

vi. (අ) ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණයේ රචකයා කවුරුන් ද?
(ආ) එම රචකයා සංස්කරණය කළ කවි සඟරාව කුමක් ද?

vii. පහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
රන් විමනේ සිටිමුත් දුක නැති වෙත්ද
පැණි මීයේ කෑමුත් බඩගිනි නැද්ද
(අ) ..........................................
(ආ) ..........................................

viii. පහත සඳහන් අය සිටි නගර සඳහන් කරන්න.
(අ) ගුත්තිල ඇදුරුතුමා.
(ආ) මූසිල ඇදුරුතුමා.

ix. (අ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර වූ ග්‍රන්ථය සඳහන් කරන්න.
(ආ) සිංහබාහු නාට්‍යයට මූලාශ්‍ර වූ කතාව සඳහන් කරන්න.

x. පහත සඳහන් කෘතිවල කතුවරු ලියන්න.
(අ) නන්දන ගීත.
(ආ) කුණාටුව.

(ලකුණු 2×10=20)

EXAMRESULTS.LK

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. මෙසේ හටගත් බිය සැක සිතින් පහ කරමින
තොසේ වෙමින් එ මිහිඳා වෙසෙන සඳ පෙමින
බසේ මුවින් පිට වුණ නිසා වැඩුණ කුහුලින
විසේ සය පියාගේ දකිති දරුවෝ දින දින

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙහි සඳහන් වන පියාගේ විශේෂත්වය කුමක් ද?

ii. "ඒකාකාරී ජීවිතයක් දැඩි උණුසුම් වාතයත් සමඟ කෙළවරක් නැති ගසුත්, කෙළවරක් නැති කම්කටොලුත් හමුවේ ඔවුන්ගේ චේතනා ශක්තියත්, කල්පනා ශක්තියත්, වේදනා ශක්තියත් විලීනව මිය යන්නේය."
(අ) මේ ධර්මතාවට මුහුණ දෙන්නේ කවුරුන් ද?
(ආ) ඉරි ඇඳි කොටසේ අදහස ලියන්න.

iii. "කොල, වඳනා කෙනෙක් නළල දණ වැලමිටි ලේ ලා ගෙනත් වඳිද්දද මේ වැඳීම් මාන තොප අතින් අද ඇසිමි"
(අ) මේ කවුරුන් විසින් කාහට කරන ප්‍රකාශයක් ද?
(ආ) මෙසේ ප්‍රකාශ කිරීමට හේතුව කෙටියෙන් ලියන්න.

iv. නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පහින රිලවුන්ට ඉනි මං කමක් නැත

(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත කවියේ මුල් පදයේ අදහස ලියන්න.

v. තත මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය සිරි සඳ ගෙන වැළැන්දේ

(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත කවියේ අවසන් පදයේ අදහස ලියන්න. (ලකුණු 4×5=20)

03. i. යහපත් ජීවිතයක් සඳහා ජනකවියෙන් ලද හැකි ආභාසයත්,
ii. ජනකවියා තම නිර්මාණ රසවත් කිරීමෙහිලා කාව්‍යාලංකාර යොදා ගෙන ඇති ආකාරයත් "හානා හීය පානා අඬහැරෙන් දැනේ" පාඩමින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත්

i. දරිද්‍රතාවයෙන් පෙළෙන මිනිසුන් පිළිබඳවත්,
ii. කැලේට නතුවී විනාශ වී යන ගමක් පිළිබඳවත් බැද්දේගම නව කතාවෙන් කියවේ. නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න. (ලකුණු 15)

04.i. සිංහබාහු තරුණයෙකුගේ අදහස් හා ක්‍රියා කාරීත්වය ප්‍රදර්ශනය කරන ආකාරයත්,
ii. සුප්පා දේවිය දරුවන්ගේ සුබ සිද්ධිය තකා කටයුතු කරන ආකාරයත්,
නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත්

i. ජාතිකාභිමානය ඉස්මතු කිරීමත්,
ii. චරිත සංවර්ධනයට මඟ පෙන්වීමත් යන කරුණු නිසා "මුනි සිරිපා සිඹිමින්නේ" පද්‍ය නිර්මාණය රසවත් නිර්මාණයක් වී ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

05. "ප්‍රඥාවන්තයා සියලු අභියෝග ජයගන්නා බව මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිතයෙන් කියවේ." නියමිත කොටසින් උදාහරණ තුනක් දෙමින් මේ කියමන පහදන්න. (ලකුණු 10)

06. විවිධ කාව්‍යෝපක්‍රම මගින් තම පද්‍ය නිර්මාණය රසවත් කර ඇති ආකාරය ගංහාවේ සංගීතය පද්‍ය නිර්මාණයෙන් උදාහරණ තුනක් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

PAST PAPERS WIKI

07. ගුත්තිල ඇදුරුතුමා විශිෂ්ට වීණා වාදකයෙකි. නියමිත කවිවලින් උදාහරණ තුනක් දෙමින් මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 10)

පිළිතුරු පත්‍රය i

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. 2 | 2. 1 | 3. 3 | 4. 4 | 5. 1 | 6. 2 | 7. 3 |
| 8. 2 | 9. 4 | 10. 3 | 11. 1 | 12. 2 | 13. 3 | 14. 4 |
| 15. 3 | 16. 3 | 17. 1 | 18. 4 | 19. 2 | 20. 4 | 21. 1 |
| 22. 4 | 23. 2 | 24. 4 | 25. 2 | 26. 4 | 27. 2 | 28. 2 |
| 29. 1 | 30. 1 | 31. 2 | 32. 2 | 33. 3 | 34. 3 | 35. 4 |
| 36. 3 | 37. 3 | 38. 1 | 39. 4 | 40. 2 | | |

පිළිතුරු පත්‍රය ii

(1) i. සරලව - යාළුවා, රමණිය, ලවන, වංශය ආදි වචන දෙකක්.

ii. විකාසනය, ලේඛනය.

iii. අමාහැල්ලෙන් - අමෘතය නැමැති දියදහර කෝගිනිකඳ - කෝපය නැමැති ගිනි ජාලාව.

iv. (අ) ගුවන්යානා පෙළ ඈත අහසේ කරනම් ගසයි.

(ආ) ඕතොමෝ ආදරයෙන් සෙනෙහසින් මව රැකබලා ගත්තාය.

v. නිතර, ය, ඉඳහිට.

vi. අධි - අධිරාජ්‍යය. සම් - සම්පාදනය -උපසර්ග.

වි - විශිෂ්ට / ලවා, සමග, ම

vii. දුම්+කොළ-දුංකොළ. තුනු+අඟ-තුනුවඟ.

viii. (අ) බල්ලෙකු විසින් හාවෙක් පසුපස දුවනු ලබයි / දිවෙයි.

(ආ) සෙබල මුළ විසින් සතුරෝ මර්දනය කරනු ලැබුහ / ලදහ.

ix. (අ) සායම ගියා

(ආ) කැලයකට හඳ පැව්වා වගේ.

x. "මගේ වින්දනයට හේතු වූයේ නම් මේ කරුණුය. එම කරුණු සලකනොත් මබටද එබඳු වින්දනයක් ඇති විය යුතුය" යි ඔහු කියයි. (විරාමලකුණු ලකුණු 1/2 ×4 - ලකුණු 2)

(2×10-20)

<u>රචනය</u>

(2) 1. සාරවත් භාවය, මාතෘකාවද ඇතුළු ව - ලකුණු 08යි.

2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12යි.

3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීමට - ලකුණු 05යි.

මුළු ලකුණු - 25යි.

<u>සාරාංශය</u>

(3) කතාබහ මගින් සන්නිවේදනය කිරීමේ පුරුද්දට දිගු ඉතිහාසයක් ඇත. මානවයා දෙපයින් සිටගත් දා සිට දෑත්, මොළය වඩාත් කාර්යක්‍ෂම වීය. මෙහි ප්‍රතිඵල වූයේ භාෂණයට හුරුවීමයි. මෙය දිගු කාලීනව අනුක්‍රමයෙන් වර්ධනය වූවකි. ආදි මානවයා ශබ්ද අතර වෙනස හඳුනා ගැනීමටත් වචන නිර්මාණයටත් දිගුකාලයක් ගතකර ඇත. මිනිසා භාෂණය ආරම්භකර ඇත්තේ මීට අවුරුදු දස ලක්ෂයකට පමණ පෙරය.

(වචන 50)

<u>ලකුණු විග්‍රහය</u>

1. අන්තර්ගතය ලකුණු 06යි.
2. වචන ගනන ලකුණු 02යි.
3. ශිල්පියදක්ෂතා ලකුණු 02යි.

මුළු ලකුණු 10යි.

(04)i. කුමාරතුංග මුණිදාස මහතා

ii. රැපියල් තෙන්නකෝන්, අරිසෙන් අහුබුදු, හියබත් දිසානායක.

iii. •කාව්‍ය භාෂාවට හෙළ වදන් වීම.

•ගී කාව්‍ය භාෂාවට සමීප බව.

•නිවැරදි භාෂා ව්‍යාකරණ භාවිත කිරිම.

•අර්ථ රසයට වැඩි නැඹුරුවක් හැකි වීම.

(මෙයින් දෙකක් අවශ්‍ය වේ)

iv. සිලෝවිරිත

v.සමකාලීන සමාජය උපහාසයට ලක් කිරීම. (උපහාසය මුසු නිර්මාණ ඉදිරිපත් කිරිම)

(05) <u>ප්‍රායෝගික ලේඛන</u>

ආකෘතිය ලකුණු 04

අන්තර්ගතය ලකුණු 08

ශිල්පීය දක්ෂතා ලකුණු 03

15

PAST PAPERS WIKI